# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022

2024 ඔක්තෝබර් / නොවැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

වාස්තුශාස්ත්‍ර

## VAST 18214 - වාස්තුශාස්ත්‍රයෙහි ක්‍රමාභිවෘද්ධිය

පළමු හා දෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ඇතුළත් වන ලෙස ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03.00 යි.

---

I කොටස

01. "භාරතීය ගෘහනිර්මාණ සම්ප්‍රදායෙහි සංවර්ධිත ලක්ෂණ සමකාලීන සාහිත්‍යය මූලාශ්‍රයන්හි විද්‍යමාන වේ." රාමායණ වීරකාව්‍යය ඇසුරෙන් පහදන්න. (ලකුණු 20යි.)

02. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයෙහි සඳහන් නගර සැලසුම්කරණ සංකල්පයන්හි සංවර්ධිත ලක්‍ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

03. "විධිමත් ගෘහනිර්මාණ සැලසුම්කරණයක අවශ්‍යතාව බුද්ධකාලීන භාරතයේ ද පැවත ඇති බව බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය තුළින් අනාවරණය වේ." විස්තර කරන්න. (ලකුණු 20යි.)

04. ඍග්වේදයෙහි හමුවන වාස්තුශාස්ත්‍රීය සාධක පහත මාතෘකා ඔස්සේ විස්තර කරන්න.
    - අභිචාර විධි
    - ගෘහනිර්මාණ ශිල්පීන්
    - පාරිභාෂික සංඥා
    - ගෘහවර්ග (ලකුණු 20යි.)

## II කොටස

05. ලාංකේය පුරාණ නගර සැලසුම්කරණයෙහි විධිමත් ලක්ෂණ අනුරාධපුර නගර සැලසුම්කරණය ඇසුරෙන් සාධනය කරන්න. (ලකුණු 20යි.)

06. ලාංකේය ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වය සීගිරි බලකොටුව ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20යි.)

07. පුරාණ මයිමතය ග්‍රන්ථය තුළින් ප්‍රකට කෙරෙන ලාංකේය ගෘහනිර්මාණ ශිල්පයෙහි අනන්‍ය ලක්ෂණ විමර්ශනය කරන්න. (ලකුණු 20යි.)

08. වාස්තු යනු කුමක් දැයි හඳුන්වා, එහි ක්‍රමාභිවෘද්ධියට භාරතීය ගුරුකුලයන්හි බලපෑම සිදු වී ඇති ආකාරය විමසන්න. (ලකුණු 20යි.)